www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# එක්සත් ජනපද ආන්ඩුව වෝල් වීදියට ඇප බඳියි

## US government to bail out Wall Street

**බැරී ග්‍රේ විසිනි**

**2008 සැප්තැම්බර් 20**

බුෂ් පරිපාලනය සැප්තැම්බර් 19 වන දින එක්සත් ජනපද බැංකු වෙනුවෙන් දැවැන්ත හා පෙර නොවූ විරූ ඇප දීමක් පිලිබඳ සැලසුම් නිවේදනය කලාය. එදින උදේ වෙන වෙනම මාධ්‍ය හමුවේ පෙනී සිටි භාන්ඩාගාර ලේකම් හෙන්රි පෝල්සන් හා ජනාධිපති ජෝර්ජ් බුෂ්, බිඳ වැටෙන මූල්‍ය වෙලඳපොලවලට මුක්කුව දීමේ පියවර මාලාවක් නිවේදනය කල අතර, ලබන සතියෙ 'දී මෙම නීති සම්මත කරන ලෙස කොන්ග්‍රසයෙන් ඉල්ලා සිටියේ ය. පෝල්සන්ගේ ම වචනවලට අනුව, "බිලියන සිය ගනනක් වූ" ඇමරිකානු බදු ගෙවන්නන්ගේ ඩොලර්, කිසිදු වටිනාකමක් නැති උකස්කරයන්ගේ පිටුබලය සහිත, වෙලඳපොලේ අලෙවි කිරීමට නොහැකිව කඳු ගැසී ඇති වත්කම්, මිලට ගැනීම සඳහා බැංකුවලට හෝ අනෙකුත් මූල්‍යායතනවලට නිකුත් කරනු ලැබේ.

ආන්ඩුවේ සැලැස්ම පිලිබඳ විස්තර කොන්ග්‍රස් නායකයන් හමුවේ තැබීම සඳහා මේ දින දෙක තුල තමන් ඔවුන් හමුවන බව පෝල්සන් නිවේදනය කලේ ය. මේ සැලැස්මට අනුව, බැංකු විසින් ගොඩ ගසාගෙන ඇති දැවැන්ත නය කන්දරාවේ සම්පූර්න මිල ඇමරිකානු ජනතාවගේ කර මතට පාත් කරනු ලැබේ. බැංකුවල වගකීම් සම්භාරය ෆෙඩරල් ආන්ඩුව කරා මාරු කිරීම මගින් ආන්ඩුවේ අය වැය පරතරය හා රාජ්‍ය නය තියුනු ලෙස ඉහල යන අතර, එක්සත් ජනපදයේ නය ගෙවීමේ හැකියාව තව දුරටත් බාදනය වීමෙන් එක්සත් ජනපද ඩොලරයේ අගය මත තවත් විශාල ප්‍රශ්නාර්ථයේ සලකුනක් ද තබනු ඇත. මහ බැංකුවේ වැහැරෙන ශේෂ පත්‍රය පුම්බාලීම සඳහා පසුගිය සතිය තුල පමනක් එක්සත් ජනපද භාන්ඩාගාරය ඩොලර් බිලියන 200 ක මුදලක් එන්නත් කලේය. මහ බැංකුව දැනට මත් නය හා සහන ලෙස බිලියන සිය ගනනක් වෝල් වීදියේ ප්‍රධාන බැංකු වෙත ගෙවා ඇති අතර මේ සතියේ දී ඇමරිකානු ඉන්ටර්නැෂනල් ගෲප් නමැති යෝධ රක්ෂන සමාගමේ පාලනයෙන් සියයට 80 ක් පවරා ගැනීම වෙනුවෙන් තවත් බිලියන 85 ක් මුදා හලේය.

රිපබ්ලිකානු සෙනේට් සභික ජෝන් මැකේන් හා ඩිමොක්‍රටික් සෙනේට් සභික බරක් ඔබාමා යන ප්‍රධාන පක්ෂ දෙකේම ජනාධිපති අපේක්ෂකයන්, බැංකු හා මහා ආයෝජකයන්ට තොග පිටින් ඇප දීම සඳහා වහාම සිය සහාය පල කලහ. ප්‍රමුඛ ඩිමොක්‍රටික් කොන්ග්‍රස් සභිකයෝ ඊලඟ සතියේ දී අවශ්‍ය පනත සම්මත කිරීම සඳහා පෝල්සන්, මහ බැංකු සභාපති බෙන් බර්නන්කේ හා බුෂ් විසින් කරන ලද ඉල්ලීම්වලට එකඟ වන බවට සහතික වූහ. වෝල් වීදියට ඇප දීම පිටුපස ප්‍රධාන පක්ෂ දෙක හා මාධ්‍ය ජාලයන් වහාම පෙල ගැසීම, ගිලා බසින ජීවන තත්වයන්, රැකියාවලින් දොට්ට දැමීම් හා නිවාස අහිමි වීමේ නැඟෙන වඩදිය රැල්ලට මුහුනපා සිටින මිලියන ගනනක් වන ඇමරිකානු වැඩ කරන ජනතාවගේ දුක් ගැනවිලි සම්බන්ධයෙන් ඔවුන් දක්වන නිෂ්ක්‍රීය හා උදාසීන ආකල්පයට සපුරා ම වෙනස් තත්වයකි. ජනතාවගේ සමාජ අවශ්‍යතාවන් පිලිබඳ ප්‍රශ්නයේ දී ඇමරිකානු ව්‍යාපාරිකයේ හා පක්ෂ දෙකේ අඳෝනාව වන්නේ " මුදල් නැතිකම" වුවත්, මූල්‍ය ප්‍රභූවේ සමෘද්ධියට තර්ජනයක් එල්ල වන විට මොහොතක පමන දැනුම් දීමකින් අසීමිත සම්පත් හා ආන්ඩුවේ පූර්න බලතල ඒ සඳහා මුදා හැරේ.

නිවාස වෙන්දේසි කිරීම නතර කිරීමේ හෝ දැනට මත් නිවාස අහිමි වූවන්ට සහන සැලසීම ඇතුලු කම්කරු පන්තිය සඳහා කිසිදු සහනයක් බුෂ්ගේ හෝ පෝල්සන්ගේ ප්‍රකාශයන්හි යෝජනා කෙරී නැත. ඒ වෙනුවට මහජන අරමුදල්වලින් බිලියන සිය ගනනක්, බොහෝ විට ට්‍රිලියන ගනනක්, බැංකුවලට මුක්කු ගැසීම සඳහා මුදා හැරේ.

මීලඟ ආන්ඩුව හොබවන්නේ ඔබාමා වුවත් මැකේන් වුවත්, සෞඛ්‍ය පහසුකම් හා සමාජ රක්ෂන ද ඇතුලු සමාජ වැඩ පිලිවෙලවල්වලින් ඉතිරිව ඇති දේ මත තව තවත් ප්‍රහාර එල්ල කිරීම හා කම්කරුවන්ගෙන් මීටත් වඩා "කැපකිරීම්" ඉල්ලා සිටීම යුක්ති සහගත කිරීමට බංකොලොත් වන ආන්ඩුවේ තත්වය යොදාගනු ඇත. ඇමරිකානු ප්‍රජාත්‍රන්තවාදයේ වහන්තරාව පිටුපස ඇති මහා ව්‍යාපාරිකයන්ගේ ඒකාධිපතිත්වය මීටත් වඩා පැහැදිලිව ප්‍රදර්ශනය කරන අවස්ථා විරල ය.

18 වන දින රාත්‍රියේ බර්නන්කේ හා සුරැකුම් හා හුවමාරු කොමිසමේ සභාපති ක්‍රිස්ටෝපර් කොක්ස් පසෙකින් පෙල ගැසුනු පක්ෂ දෙකේම කොන්ග්‍රස්

සහිකයන් හමුවීමෙන් පසුව පෝල්සන් සිය නිවේදනය නිකුත් කලේය.

රුස්වීමේ දී පෝල්සන් එක්සත් ජනපද හා ගෝලීය මූල්‍ය පද්ධතිය බිඳ වැටීමේ අද්දරට පැමින ඇති බවට අනතුරු අඟවමින් බැංකුවල ශ්‍රේෂ පත්‍රයන්ගෙන් "ද්‍රවශීලතාවය රහිත" උකස්කරයන්හි පිටුබලය ලබන සුරැකුම් පවරා ගන්නා ආන්ඩුවේ ආයතනයක් පිහිටුවීමේ කෙටුම්පතක් ගෙන හැර දැක්වී ය.

සැලැස්ම පිලිබඳ ආරංචි එදින සවස පැතිර ගියේ, එක්සත් ජනපද, යුරෝපා, කැනඩා හා ජපාන මහ බැංකු දැවැන්ත මුදල් ප්‍රමානයන් පොම්ප කිරීම මඟින් ඊට පෙර දිනවල බිඳවැටී තිබුනු නය වෙලඳපොලවල් ගලවා ගැනීමට දැරූ උත්සාහය අසාර්ථකවී තිබුනු අවස්ථාවකය. නය වෙලඳපොලවල් ක්‍රියාකාරී නොවන තැනකට ම වැටී තිබුනු තත්වය තුල, මූල්‍ය වෙලඳපොලවල හා ප්‍රධාන සමාගම් වල විශ්වාසය තියුනු ලෙස පහත බැස තිබුනු අතර, ෆෙඩරල් මහ බැංකුව ප්‍රාන්ත මහ බැංකු වලට බිලියන 180 ක් හා අන්තර් බැංකු නය ගනු දෙනු හා සමාගම් වලට නය දීම සඳහා අනෙකුත් බැංකු වෙත බිලියන 120 ක් ද නය වශයෙන් මුදා හලේය. එහෙත් අනෙකුත් සමාගම් වලට අලුතින් නය නිකුත් කිරීම වෙනුවට විශාල බැංකු කලේ නය පැහැර හැරීමකට මුහුන නොදී ආරක්ෂාවීම සඳහා එම මුල් තමන් වෙත රඳවා ගැනීමයි.

1929 කොටස් වෙලඳපොල කඩා වැටීමෙන් පසුව තවත් මහා අවපාතයකට ගමන් ගනිමින් තිබේ යයි පුලුල්ව පිලිගන්නා තත්වයක් තුල ලෝක ධනේශ්වර පද්ධතියේ බිඳ වැටීම සිදුවූයේ උකස් වෙලඳපොල යෝධයන් වූ ෆැනී හා ෆ්‍රෙඩී මැක් එක්සත් ජනපද ආන්ඩුව වෙත පවරා ගැනීමෙන් සති දෙකක් ඉක්ම යාමටත් පෙරය. මේ සතිය තුල වෝල් වීදියේ සංකේතයන් බඳුවූ ලේමන් බ්‍රදර්ස් හා මෙරිල් ලින්ච් ඇද වැටීමෙන් පසුව ඇමරිකන් ඉන්ටර්නැෂනල් ග්‍රෑප් ආන්ඩුවට පවරා ගනු ලැබිනි. මෙම වර්ධනයන්ගෙන් පසුව අනෙකුත් ප්‍රධාන එක්සත් ජනපද බැංකු ඉමහත් පීඩනයකට හසුවෙමින් බංකොලොත්වීමේ අද්දරට ගමන් කලේය. එයට මෝර්ගන් ස්ටැන්ලි ආයෝජන බැංකුව හා නය හා ඉතුරුම් යෝධයෙකු වූ වොෂිනටන් මියුචුවල් ද ඇතුලත් විය. ආයතන දෙකෙහි ම කොටස් මිල ගිලී යද්දී ඔවුහු ගැනුම් කරුවන් සොයා ගැනීමට පොරකමින් සිටියහ. එක දිගට බැංකු ඇද වැටීමේ බලපෑම එක්සත ජනපදයේ විශාලතම ආයෝජන බැංකුව වන ගෝල්ඩ්මන් සැක්ස් වෙත තර්ජනාත්මකව ලඟා විය. භාන්ඩාගාර ලේකම් වීමට පෙර එහි ප්‍රධානියා ලෙස කටයුතු කලේ පෝල්සන්ය. සතිය තුල ඔහුගේ කොටස් වටිනාකම් ඉමහත් අලාභයන්ට මුහුන පෑවේය.

එක්සත් ජනපදයේ ප්‍රධාන මුදල් වෙලඳපොල අරමුදල්, පාඩු වාර්තා කිරීමත් සමහරක් වසා දැමීමට බල කෙරීමත් සමඟ 16 හා 17 යන දිනවල අර්බුදය අග්ගිස්සට ම පැමිනියේ ය. මෙය අරමුදල් ඉවතට ගලා යාමක ආරම්භය විය. 17 වන දින විශාලතම අරමුදල්වලින් බිලියන 78.7 ක් ඉවත් කර ගන්නා ලදී. එක් කාර්මික තක්සේරුවකට අනුව එම දෙදින තුල බිලියන 145.3 ක් ආපසු ගෙන තිබේ.

මුදල් වෙලඳපොල අරමුදල්, ආයෝජනය සඳහා සුරක්ෂිත ම ක්‍රමය ලෙස සලකන ලදී. මිලියන ගනන් ඇමරිකානුවන්ගේ ඉතුරුම් තැන්පතු ඇත්තේ මේවායෙහි ය. වෝල් වීදියේ දෘෂ්ටි කෝනයෙන් ගත් කල මෙම අරමුදල්, කඩිමුඩියේ ම බැංකු හා සමාගම් විසින් නිකුත් කරන "වානිජ්‍ය නෝට්ටු" ලෙස හඳුන්වන කෙටි කාලීන පොරොන්දු නෝට්ටු මිලට ගනිමින් ඒවා මුදල් වෙලඳපොලට නිකුත් කිරීමට පටන් ගත්තේ ය. ඇවිලී ගිය මුදල් වෙලඳපොලවල අරමුදල් අර්බුදය "වානිජ්‍ය නෝට්ටු" වෙලඳපොල කඩා වැටීමේ තර්ජනය මතු කලේ, ආර්ථිකය පුරා ම බංකොලොත්වීම් හා නය පැහැර හැරීම් පිලිබඳව එකක් පසුපස එකක් වශයෙන් පැමිනෙන ප්‍රතික්‍රියා මාලාවක් උසිගන්වා ලමිනි.

"මුදල් වෙලඳපොලවල් හිස් වීම බියකරු සිහිනයක් වැනිය. සැබවින්ම එය එලඹෙන බිහිසුනු අරගලයක පෙර නිමිත්තකි. එය සිදු වීමට ඔවුන් ඉඩ නොදෙනු ඇතැයි.'' පැසිෆික් ඉන්වෙස්ට්මන්ට් මැනේජ්මන්ට් සමාගමේ පෝල් මැක් ගලී පැවසීය.

මෙම සතියේ ප්‍රථම වැඩ කරන දින තුන තුල ඩව් ජෝන්ස් කාර්මික මිල දර්ශකය ඒකක 800 කින් පමන පහත වැටී ඇත. 18 වන දින සවස ෆෙඩරල් මහ බැංකුව හා අනෙකුත් ප්‍රාන්ත මහ බැංකුවල ඒකාබද්ධ මෙහෙයුමක් මඟින් එදින උදේ පැවති තත්වය වෙනස් කරනු ලැබිනි. සවස තුන වන විට බැංකුවලට ඇප දීමේ ආන්ඩුවේ සැලැස්ම ප්‍රසිද්ධියට පත්වීමත් සමඟ නිව් යෝර්ක් කොටස් හුවමාරුව ඔල්වරසන් දීගෙන නැඟී සිටියේය. මිලට ගැනීමේ උමතුවකින් වෙලඳපොල වහා ම කනපිට හැරුනු අතර මිල ගනන් පිම්මේ ඉහල නැඟුනි.

වෙලඳමේ අවසන් පැය තුල ඩව් ජෝන්ස් කාර්මික දර්ශකය ඊට පෙර දින සිදු වූ ඒකක 449 ක අලාභයෙන් වැඩි පංගුවක් යලි අත්කර ගත්තේ ඒකක 410.03 කින් ඉහල නගිමිනි. මෙය සය වසරක් තුල එක් දිනක අත් කර ගත් ඉහල ම ප්‍රතිශත අගයයි. දවස මැද භාගයේ පහල අගයක සිට සවස් වන විට ඉහල නැඟීම අවසන් වූයේ ඒකක 617 ක් වාර්තා කරමිනි.

ලොකු ජයග්‍රාහකයන් වූයේ මූල්‍යායතනයන් ය. මෝර්ගන් ස්ටැන්ලි හා වොෂින්ටන් මියුචුවල් දැවැන්ත පාඩු විඳීමෙන් පසු විශාල වාසි අත්කර ගත්හ. 19 වන දින උදෑසන ආන්ඩුව වෙලඳපොලවලට ඇපදීමේ ක්ෂනික පියවර මාලාවක් නිවේදනය කලේය. පහත වැටෙන මිල ගනන් මත ඔට්ටු ඇල්ලීමේ කෙටිකාලීන මූල්‍ය කොටස් අලෙවිය තාවකාලිකව තහනම් කිරීම හා මුදල් වෙලඳපොල අරමුදල් රක්ෂනය කිරීමේ බිලියන 50 ක ආන්ඩුවේ සැලැස්මක් ද ඊට ඇතුලත් විය. දැනට ආන්ඩුවේ අයිතිය යටතේ පවතින ෆැනී හා ෆ්‍රෙඩී මැක් සමාගම උකස්කරයන්ගේ පිටුබලය සහිත සුරැකුම් මිලට ගැනීම ඉහල නංවන බවත් එවන් වත්කම්වලින් විශාල සංඛ්‍යාවක් කෙලින් ම තමන් මිලට ගන්නා බවත් භාන්ඩාගාර දෙපාර්තමේන්තුව නිවේදනය කලේ ය. වානිජ්‍ය නෝට්ටු වෙලඳපොල හිරිවැටීමෙන් ගලවා ගැනීම සඳහා බැංකුවලට අඩුපොලී නය නිකුත් කරන බව මහ බැංකුව නිවේදනය කලේ ය.

මෙම පියවර ද, පෝල්සන් හා බුෂ්ගේ ප්‍රකාශයන් ද කොටස් හුවමාරුවේ තවත් ජයපැන් බීමක් සඳහා දොරටු විවර කල අතර 19 වන දින අවසානයේ ඩව් ජෝන්ස් දර්ශකයේ ඒකක 368.75 ක නැඟීමක් වාර්තා විය.

සිය ප්‍රකාශය තුල පෝල්සන් මෙසේ පැවසීයඃ "අපගේ මූල්‍ය ක්‍රමය මුහුනපා ඇති ප්‍රධාන ගැටලුවට පිලියම් සෙවීම සඳහා පරිපූර්න ක්‍රියාවලියක් අවශ්‍ය ය. අපගේ දුර්වල කම යටින් ඇත්තේ නිවාස වෙලඳපොල නිවැරදි කිරීමේ ක්‍රියාවලිය ඉදිරියට යන විට අපගේ මූල්‍ය ක්‍රමය අද දින ද්‍රවශීලතාවක් නැති උකස් වත්කම්වලින් පීඩාවට පත්ව තිබීමයි."

මෙය පචයකි. අර්බුදයට මූලික හේතුව, ඇමරිකානු ධනවාදයේ සීමාරහිත පරපුටු කමයි. දශක ගනනාවක කාලය තුල ඉමහත් නය කන්දරාවක් ගොඩගැසීමේ පදනම මත මූල්‍ය සමපේක්ෂනය හා තවත් එවැනි ප්‍රෝඩාකාරී මාර්ගවලින් ධනපතියන් සඳහා සුපිරි ලාභ රැස්කිරීම සඳහා ඉඩ කඩ සැලසීමට කර්මාන්තයේ විශාල පදාසයක් උගුල්ලා දැමීමයි. දැන් එහි වන්දිය ගෙවීම ඇමරිකානු කම්කරු පන්තියේ කර මතට පාත් කරනු ලැබේ.

"නිදහස් ව්‍යවසායකත්වයේ අපගේ ක්‍රමයෙහි" නාමයෙන් වෝල් වීදිය බේරා ගැනීම සඳහා පෝල්සන්, බර්නන්කේ හා කොක්ස් පසෙකින් තබාගෙන, ජෝර්ජ් බුෂ් ආන්ඩුවේ මැදිහත්වීම ඉල්ලා සිටියේ ය.

"මෙම ගැටලුවේ මූලාරම්භය ගැන විවාද කිරීමට විශාල ඉඩ ප්‍රස්ථාවන් පවතියි. එහෙත් දැන් එය විසඳීමට කාලයයි." ඔහු පැවසී ය.

සත්‍ය නම් කිසිදු විවාදයක් හෝ සාකච්ඡාවක් නොපැවතීමයි. ලෝක ඉතිහාසයේ දැවැන්තම මූල්‍ය මගඩිය සඳහා වගකිව යුත්තන් කිසිවෙකුටත් චෝදනා එල්ල කරනු නැත. කිසිදු දඬුවමක් පැනවෙනුයේ ද නැත. මිලියන සිය ගනනක් ඇමරිකාවෙන් කොල්ලකා ගත් කිසිවෙකුගෙන් හෝ සතයක් වත් අය කරගනු ද නැත.

එක්සත් ජනපදයේ සියලු මූල්‍ය සම්පත් වෝල් වීදිය වෙනුවෙන් වෙන්කර ඇත. රටේ ධනවත්ම මිනිසුන්ගේ නය පියවීමේ වගකීම පවරා ඇත්තේ සමස්ත ඇමරිකානු පුරවැසියන් වෙත ය. ඒ සඳහා ඔවුන් කිසිවෙකුගේ අදහස් විමසීමක් සිදු කර නැත. සත්තකින් ම දේශපාලන විරුද්ධ පක්ෂය යයි කියනු ලබන ඩිමොක්‍රටික් පක්ෂයෙන් මොනම අභියෝගයක් හෝ විරුද්ධත්වයක් එල්ල නොවනු ඇත. 19 වන දින මියාමාහි දී කථාකරමින් ඔබාමා කියා සිටියේ ඇප බැඳීමේ සැලැස්මට තමන් පූර්න සහයෝගය ලබාදෙන බවයි. "අපගේ විසංවාදී ආර්ථික න්‍යාය පත්‍රයන් ගැන ජෝන් මැකේන්ට මා සමඟ එලඹෙන වසරේදී විවාද කල හැකිය. එහෙත් මෙම වසරේදී මේ රටට ඉක්මනින්ම අවශ්‍යවන්නේ කුමක් ද යන්න මත අප එකට එක්වී වැඩ කල යුතුය"යි ඔහු පැවසීය.

සිය රිපබ්ලිකානු විරුද්ධවාදියාට නොදෙවෙනි අයුරින් ඔබාමා ද වෝල් වීදියට බැඳී සිටියි. සැබවින්ම මූල්‍ය ව්‍යාපාරික අංශයෙන් මැකේන්ට ලැබුනු මැතිවරන අරමුදල ඩොලර් මිලියන 19.6 කි. ඔබාමාට මිලියන 22.5 ක් ලැබුනි.

19 වන දා පරිපාලනයේ සැලැස්මට පිටුබලය සැපයීම සඳහා ඩිමොක්‍රටික් නායකයෝ පෙල ගැසී සිටියහ. ඒකාබද්ධ ආර්ථික කමිටුවේ සභාපතිත්වය දරන නිව් යොර්ක් සෙනේට් සභික චාර්ල්ස් ෂුමර් කියා සිටියේ කොන්ග්‍රසයට සතියක් ඇතුලත මෙම යෝජනාවලිය අනුමත කල හැකිවේ යයි තමා ශුභවාදී වන බවයි.

මන්ත්‍රී මන්ඩල මූල්‍ය සේවා කමිටුවේ සභාපති මැසෙචුසෙට්ස් ඩිමොක්‍රටික් මන්ත්‍රී බර්නි ෆ්‍රෑන්ක් ප්‍රකාශ කලේ බදාදා වන විට තම කමිටුවට යෝජනාවලිය ගැන ඡන්ද විමසුම පැවැත්විය හැකි වන බවයි. "ඔවුන් කීවේ මෙය කිරීමට නීතියක් ඇත්නම් හොඳ බවයි. එය කිරීම සඳහා නීතියක් ලැබෙන බවට අප අතර ඒකමතිකත්වයක් ඇත." ෆ්‍රෑන්ක් එසේ පැවසී ය.

නියෝජිත මන්ත්‍රී මන්ඩලයේ කථානායක ඩිමොක්‍රටික් පක්ෂයේ නැන්සි පෙලෝසි ඊට එකතු කරමින් "කාලය රන් හා වටිනා බැවින් අපි ඉතා ඉක්මනින් ක්‍රියාත්මක වීමට බලාපොරොත්තු වෙමු" යයි සැවසුවාය.

මූල්‍ය ප්‍රභූවේ පෙට්ටගම් වෙත රටේ සමස්ත ධනය ම හරවා යැවීමේ මෙම යෝජනා ක්‍රමය පෙරට තල්ලු කිරීමට සම්බන්ධ සියල්ලෝ ම එහි ප්‍රතිපලය වශයෙන් ලැබෙන මුදල් පංගුවට ඉව අල්ලති. ගෝල්ඩ්මන් සැක්ස් යන ඇමරිකාවේ විශාලතම ආයෝජන බැංකුවේ සභාපති ලෙස කටයුතු කල

පෝල්සන් එයින් මිලියන සිය ගනනක් උපයා ගත්තේ ය. පෙලෝසිට ඇමරිකන් ඉන්ටර්නැෂනල් ගෲප් යන රක්ෂන සමාගමේ විශාල ආයෝජනයන් සඳහා හිමිකම් ඇත. දෙපක්ෂයේ ම කොන්ග්‍රස් නායකයන් දශ ලක්ෂ පතියන් වන අතර, මහා ව්‍යාපාරිකයේ ගතමනාව මත තේරී පත්වීම පිලිබඳව විශ්වාසය තබා සිටිති. ඔවුන් සියලු දෙනාම මෙහෙය වෙන්නේ, ඇමරිකානු පාලක පන්තියේ අවශ්‍යතාවන් පිලිබිඹු කරන සිය පුද්ගලික අවශ්‍යතාවන් මඟින්ය. 18 හා 19 යන දෙදින තුල නිවේදනය කල ආන්ඩුවේ වැඩ කටයුතු වල ප්‍රතිපල වශයෙන් සුපිරි ධනපතියන්ගේ නය සඳහා ආවරනයක් සැලසුනා පමනක් නොව, කොටස් මිල නැඟීම මඟින් තවත් මිලියන ගනන් ඔවුන්ගේ බැංකු ගිනුම්වලට එකතු වූ අතර ඔවුන්ගේ කොටස් හිමිකම් ප්‍රසාරනය විය.

© www.wsws.org